**9/11** ප්‍රහාරයන්ට ලක් වූවන් සැමරීම ඇමෙරිකානු තානාපති කාර්යාලය මගින්

2011, සැප්තැම්බර් 11 දින කොළඹදී: 2001 සැප්තැම්බර් 11 දින සිදුවූ ත්‍රස්ත ප්‍රහාර වලට ලක් වූවන් ශ්‍රී ලංකාව හා මාල දිවයින සඳහා ඇමෙරිකානු තානාපතිනි පැට්‍රීෂියා A බියුටෙනිස් ගේ නිල නිවසේදී සිහිකරන ලදී. ඔවුනට ගෞරව පුද කරමින් ඇය විසින් කල කතාවකට පසුව සර්ව ආගමික අනුස්මරණ දේශනයකට බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක්, රෝමානු කතෝලික හා ඇන්ග්ලිකානු පූජක තුමන්, හින්දු පූජක තුමකු, මුස්ලිම් හා යුදෙව් පූජක වරුන් සහභාගී වූහ. මෙම අනුස්මරණ උළෙලට තානාපති කාර්ය මණ්ඩලය සමග ආරාධිත අමුත්තෝ සහභාගී වූහ.

90කටත් වඩා අධික රටවල් සංඛ්‍යාවකින් පැමිණ සිටි 3000කට අධික පිරිසකට මරු කැඳවමින් 9/11 දින වොෂින්ටන්, නිව්යෝක්, ෂන්ක්විල්හා පෙන්සිල්වේනියා නගර වලට එල්ල කරන ලද ප්‍රහාරයන් ගැන ඇමෙරිකානුතානාපතිවරිය සඳහන් කළාය. තවද ඇය එදින ජීවිතක්ෂයට පත්වූ ශ්‍රී ලාංකික කාන්තාවක් ගැනද සඳහන් කළාය. "ශ්‍රී ලංකාවේ උපත ලබා, ජපානයේ හැදී වැඩුනු රහ්මා සලීම් ශ්‍රීක - ඇමෙරිකානු සම්භවයකින් යුතු සිය සැමියා සමග විවාහ මංගල්‍යයකට සහභාගී වීම සඳහා එදා ගුවනින් ගමන් කරමින් සිටියා. ඒ වනවිට රහ්මා සිය කුළුඳුල් දරු උපත බලාපොරොත්තුව සත් මස් ගැබිනියක වී සිටියා. ඈ ඇතුළු මගීන් රැගෙන බොස්ටන් වලින් පිටවූ ගුවන් යානය ත්‍රස්තවාදීන් පැහැර ගනු ලදුව ලෝක වෙළඳ මධ්‍යස්ථානයට කඩා වැටී තිබුණා." යැයි ඇමෙරිකානු තානාපතිවරිය පැවසුවාය.

විවිධ ත්‍රස්ත ප්‍රහාර වලට ලක් වූවත් ඒවායින් නොසැලී සාමාන්‍ය ලෙස සිය දිවි ගෙනයාමට සමත් වී සිටින ඇමෙරිකානුවන් හා ශ්‍රී ලාංකිකයින් ගැන බියුටෙනිස් තානාපතිවරිය ප්‍රසංශා මුඛයෙන් කතා කළාය. ශ්‍රී ලංකාවට පාරම්පරික වශයෙන් උරුමවී ඇති බහු - ආගමික හා බහු ජාතික අනන්‍යතාවය තව දුරටත් රැක ගත යුතු බව ශ්‍රී ලංකාව පිළිබඳව ඇගේ නිසැක ප්‍රාර්ථනය බවපැවසූ ඇය සඳහන් කලේ එම ගුණය ශ්‍රී ලංකා වාසීන්ගේ සැබෑ ශක්තිය බවත් ජාතියක් වශයෙන් නොසැලී සිටීමට එම ශක්තිය යොදා ගත යුතු බවත්ය.